# අපූරු කුරුලු පවුල



විනුකි නෙවින්සා සේනාරත්න

# අපූරු කුරුළු පවුල

කතෘ
විනුකි නෙවින්සා සේනාරත්න

**කතෘගේ වෙනත් කෘති**

ටිං ටිං ලේනා - 2024

මහාමායා බාලිකා විදුහල
3 ශ්‍රේණිය C

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN
978-624-211-189-6

# පිදුම

මහාමායා විද්‍යාලයේ විදුහල්පති තුමිය,

නියෝජ්‍ය විදුහල්පති තුමියන් හා ගුරු මණ්ඩලයට ද,

මාගේ පාසලේ සහෝදරියන්හට ද,

මාගේ ආදරණීය අම්මා, අප්පච්චී, අයියා,

අත්තම්මා හා අත්තා හට ද,

මේ පොත

ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



විනුකි බබා උදේම එයාගේ මල් වත්තට ගියා.

එයාගේ මල්වත්තේ ලස්සන ලස්සන මල් ගස් ගොඩක් තිබ්බා.

ඒ මල් වල මල් පැණි බොන්නයි, ගස් වල හැදෙන රස ගෙඩි කන්නයි කුරුල්ලොයි, සමනලයොයි, මී මැස්සොයි ගොඩක් වත්තට එනවා.

ඒ නිසා එයා හරි ආසයි උදේම නැගිටලා වත්තට ඇවිල්ලා කුරුල්ලොන්වයි සමනලයන්වයි බලන්න.

එක දවසක් උදේම එයා වත්තේ ඇවිද ඇවිද ඉන්නකොට දැක්කා කුරුල්ලෝ දෙන්නෙක් ගහක් උඩ කූඩුවක් හදනවා...



ඊට පස්සේ එයා අම්මාට කතා කරලා ඒක පෙන්නුවා.

”පුතේ ඒ කුරුලු අම්මයි කුරුලු තාත්තයි කූඩුවක් හදනවා බිත්තර දාන්න... අපි දෙන්නා හැමදාම උදේට මේ ගහ ලඟට ඇවිත් බලමු ඒ අය මොනවද කරන්නේ කියලා...” අම්මා කිව්වා.

ඉතින් ඊට පස්සේ හැමදාම උදේට විනුකි බබා අම්මත් එක්ක වත්තට ගිහින් ඒ කුරුල්ලන්ට පේන්නේ නැති වෙන්න බැලුවා මොනවද මේගොල්ලො කරන්නේ  කියලා...

කූඩුව හදලා ඉවර කරපු මේ කුරුලු පවුලේ කුරුලු අම්මා චූටි බිත්තර දෙකක් ඒ කූඩුවේ දාලා තියෙනවා විනුකි බබා එක දවසක් දැක්කා.



විනුකි බබාට හරිම සතුටුයි....

එයා දැක්කා කුරුලු තාත්තා ඇවිල්ලා කුරුලු අම්මට කෑම ගෙනත් දෙනවා. කුරුලු අම්මා කූඩුවේ ඉඳන් බිත්තර දෙක රකිනවා ...

දැන් හැමදාම විනුකි බබා හරිම ආසාවෙන් උදේට ගිහිල්ලා මේ කුරුල්ලන් දිහා බලාගෙනන ඉන්නවා...

එයාගේ අම්මා එයාට කියල තියනවා ඒ ලස්සන කුරුලු කූඩුව, බැලුවට කමක් නැහැ ඒත් කිසිම වෙලාවකව කූඩුව අල්ලන්න යන්න එපා කියලා... එහෙම වුනොත් කුරුලු අම්මයි කුරුලු තාත්තයි කූඩුවයි බිත්තරයි දාලා කූඩුවෙන් යනවා කියලා...








දවස් කීපයකට පස්සේ මේ බිත්තර දෙක කැඩිලා චූටි කුරුලු පැටව් දෙන්නෙක් එළියට ඇවිත් ඉන්නවා විනුකි බබා දැක්කා....

විනුකි බබාට හරිම සතුටුයි....

තව දවස් දෙක තුනකින් පසුව විනුකි බබා දැක්කා කුරුලු අම්මයි කුරුලු තාත්තයි දෙන්නම මේ චූටි පැටව් දෙන්නට පොඩි පොඩි කෑම ගෙනල්ල කවනවා....

දැන් නං උදේට මේ ගහ ළඟින් එන කිචි බිචි සද්දේ විනුකි බබාගේ කාමරයටම ඇහෙනවා.







කුරුලු අම්මයි, කුරුලු තාත්තයි මේ විදියට දවස් කීපයක් චුටි පැටවුන්ට කෑම ගෙනත් කවනවා විනුකි බබා දැක්කා. ටික දවසකින් මේ කුරුල්ලු පැටව් දෙන්නා එයාලගෙ චූටි තටු ගහල පියාඹන්න පුළුවන් තරමට ශක්තිමත් වෙලා හිටියා...

එක දවසක් උදේ විනුකි  බබා දැක්කා ඒ කුරුලු අම්මයි කුරුලු තාත්තයි කුරුලු බබාලා දෙන්නව කූඩුව ළඟ එළියේ තියාගෙන ඉන්නවා....

ටික වෙලාවකින් මේ චුටි කුරුලු බබාලා දෙන්නත් එක්ක මේ කුරුලු අම්මයි, කුරුලු තාත්තයි, අහසට පියාඹගෙන ගියා.

විනුකි බබාට හරිම සතුටුයි එයා අත්පුඩි ගසමින් ඒ දිහා බලාගෙන හිටියා.







ඉතිං අපි හැමෝම අපේ විනුකි බබා වගේ සත්තුන්ට ආදරේ කරමු....

ඒ වගේම සත්තුන්ට හිංසා කරන්නේ නැතුව අහිංසක සත්තුන්ව බලාගමු....

එතකොට කවදාවත් කවුරුවත් අපිටත් කරදර කරන්නේ නෑ. හැමෝම අපිට ආදරේ කරනවා...

"චූටි කුරුල්ලනි චූටි බට්ච්චනි පියා සලා අහසේ....
රංචු ගැසී පියාඹන්න ඉතින් ඔය ලස්සන ආකාසේ.... "



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN**

**978-624-211-189-6**